

7

# දෑසේ නිල් පැහැය

කවිය යනු මිනිසාගේ ජීවිතාවබෝධය පුළුල් කරන සාහිත්‍යාංගයකි. කවි රස විඳීම හා නිර්මාණය කිරීම සඳහා සහජයෙන් ලද හැකියාව, පොත් පත් පරිශීලනයෙන් ලද අවබෝධය, නිරන්තර අභ්‍යාසය අවශ්‍ය බව පුරාණ කාව්‍ය විචාරයේ දී පෙන්වා දී ඇත. විවිධ කාව්‍ය නිර්මාණ රස විඳීමෙන් අපගේ ජීවිතාවබෝධය පුළුල් වන අතර, කාව්‍ය නිර්මාණය සඳහා මග පෙන්වීමක් ද එමගින් ලබා ගත හැකි ය.

මේ පාඩමේ ඇතුළත් වන්නේ දයාසේන ගුණසිංහ කවියාගේ නිර්මාණයකි. එය 1974 රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලද 'රන් තැටියක කඳුළු' කාව්‍ය සංග්‍රහයෙන් උපුටා ගෙන ඇත. කවියකු, කෙටිකතාකරුවකු, පුවත්පත් කලාවේදියකු ලෙස ප්‍රකට දයාසේන ගුණසිංහ පරිවර්තකයෙක් ද වෙයි.

ඔබ වෙනුවෙන් ඉදෙන බතේ
සිනා හඬට කන් දීගෙන
පිඟු මොළවන විට ළිප ගිනි
දෙව් බොජුනක රස මැවෙන්න
දෑසේ නිල් පැහැය දැවී
සෙමෙන් තුරන් විය නොදැනිම.

නැවතත් එන බව නොකියා
හිරු අවරින් නැව් නැගි පසු
තනිව හඬන ලොවත් සමග
රැයට මුහුණ ලා ඉඳගෙන
ඔබ එන තුරු මග බලමින්
දිවි ගණනක් ගෙවනා විට
දෑසේ නිල් පැහැය සෙමෙන්
අඳුරට දිය විය නොදැනිම.

බත් දෙකටක් උපයන්නට
අටු කොටු පුරවා දවසෙම
මඳ සැනසිල්ලක් ලබමින්
නිදි පැදුරේ වැතිරෙන ඔබ
නගන සුසුම් කෙඳිරිලි හඬ
හද මිරිකා හළ කඳුළට
දෑසේ නිල් පැහැ සේදී
ගලා නිමා විය නොදැනිම.

නිල් ඉඳුවර නිලේ අරුම
ඈත දියඹ නිලේ වරුණ
යොවුන් වියේ නිල් දෑසට
උවම් නැතැයි කී හිමියනි
අතීතයක් ගැන සිතමින්
මගේ දෑස දෙස නොබලා
අනාගතය දෙස යොමු වූ
දුවගෙ දෑස දෙස බලන්න.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## අවබෝධය

කවි පෙළ ඇසුරෙන් පිළිතුරු ලියන්න.

1. **දැසේ නිල් පැහැය නැති වීමට කවියා දක්වා ඇති හේතු තුනක් කෙටියෙන් ලියන්න.**
2. **දැසේ නිල් පැහැය කවියා උපමා කර ඇත්තේ මොනවාට ද?**
3. **බොහෝ වෙහෙස වී ඉතා අඩු මුදලක් උපයන බව දැක්වීමට කවියා යොදා ගෙන ඇති කවි පද දෙක උපුටා දක්වන්න.**
4. **කවි පෙළෙහි ව්‍යංග්‍යාර්ථ ඉස්මතු කර දක්වන්න.**
5. **කවි පෙළ පිළිබඳ කෙටි රසාස්වාදයක යෙදෙන්න.**



# විශේෂණ පද

**විශේෂණ පද, නාම විශේෂණ පද හා ක්‍රියා විශේෂණ පද ලෙස කොටස් දෙකකට බෙදේ.**

නාම පදයක කිසියම් විශේෂ ගුණයක් දැක්වීම සඳහා යොදන පද, නාම විශේෂණ පද වේ.

ක්‍රියා පදයක කිසියම් විශේෂ ගුණයක් දැක්වීම සඳහා යොදන පද, ක්‍රියා විශේෂණ පද වේ.

ඉහත කවියේ "දැසේ **නිල්** පැහැය දැවී **සෙමෙන්** තුරන් විය..." යන යෙදුම විමසා බලන්න. එහි පැහැය යන නාම පදයේ විශේෂ ගුණයක් දැක්වීම සඳහා **'නිල්'** යන පදය යෙදී ඇත. ඒ අනුව **'නිල්'** යනු මෙහි දී නාම විශේෂණ පදයකි. එමෙන් ම එහි **'තුරන් විය'** යන ක්‍රියා පදයේ විශේෂ ගුණයක් දැක්වීම සඳහා **'සෙමෙන්'** යන පදය යෙදී ඇත. ඒ අනුව **'සෙමෙන්'** යන්න මෙහි දී ක්‍රියා විශේෂණයක් ලෙස හඳුනා ගත හැකි ය.

## ලිඛිත අභ්‍යාස

1. **පහත යෙදුම්වල ඇතුළත් නාම විශේෂණ පද උපුටා දක්වන්න.**

   i. සිනා හඬ -
   ii. දෙව් බොජුන් -
   iii. නිදි පැදුර -
   iv. ඈත දියඹ -
   v. යොවුන් විය -

2. **ඉහත 1 ප්‍රශ්නයේ දැක්වූ නාම පදවලට වෙනත් විශේෂණ පදය බැගින් යොදා නැවත ලියන්න.**

   උදාහරණ: **නිල්** පැහැය
   **රතු** පැහැය

3. **පහත වාක්‍යවල ඇතුළත් ක්‍රියා විශේෂණ පද උපුටා දක්වන්න.**

   i. දරුවා බියෙන් අඬයි.
   ii. සුළඟ වේගයෙන් හමයි.
   iii. ඔහු පරෙස්සමෙන් රිය පදවයි.
   iv. ළමයා සතුටින් සෙල්ලම් කරයි.
   v. ඇය හොඳින් ඉගෙන ගනියි.

4. **ඉහත ක්‍රියාකාරකමෙන් උපුටා ගත් ක්‍රියා විශේෂණ පද භාවිත කරමින් වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.**

5. **පහත දැක්වෙන නාම හා ක්‍රියා පදවලට විශේෂණ පද යොදා අර්ථවත් වාක්‍ය ගොඩ නගන්න.**

   i. ධාවකයා - දුවයි
   ii. සිසුවා - සමත් වෙයි
   iii. නිවේදිකාව - ප්‍රකාශ කරයි
   iv. ගස - සෙලවෙයි
   v. නැට්ටුවා - නටයි

6. **පහත ඡේදයේ සඳහන් නාම විශේෂණ පද තෝරා ලියන්න.**

සෙල්ලම් පිටියක සාදන ලද මඩුවක් සේ කැලෑ රොද අපට බෙහෙවින් ප්‍රයෝජන විය. වහින විට අප, අපගේ හිස් සෙවණ කර ගැනීමට දුවන්නේ මේ කැලෑ රොද තුළට ය. මැස්සක් මෙන් සැදුණු පඳුරු මුදුන් නිසා, කැලෑ රොද ඇතුළත බිම වහල් තලයකින් සෙවණ වුණු මඩුවක් වැන්න. ඝනව වැඩුණු අතු ඉති සහිත පඳුරු මුදුන් කිහිපයකින් සෙවණ වුණු ඇතැම් තැනක්, මහ වැස්සක දී වුව ද අප ආරක්ෂා කරයි. සෙනසුරාදාත්, ඉරිදාත් අප උදේ සිට සවස් වන තෙක් සෙල්ලම් කරන්නේ මේ කැලෑ රොද ඉදිරියෙහි වන වැලි තලාවෙහි ය.

(මඩොල් දූව - **මාර්ටින් වික්‍රමසිංහ**)



# කවියක රස විඳ නව කවි පබඳිමු

කවිය සඳහා පාදක විය යුතු අද්දැකීම් පිළිබඳව කවීන් විවිධ අදහස් දක්වා ඇත. පහත කවිය එවැන්නකි.

නැණ නැවින් සත් සයුරු තරණය කරන කවියනි, මගේ දය සතු
පණ පොවා අදහසට පදයට ලොවක් පෙරළන තරමෙ බලගතු
රණ විකුම් දක්වමින් යුද පෙරමුණට ජාතිය යැවිය හැකි මතු
ජන සිතුම්, ජන පැතුම්, ජන වේදනා ඔස්සේ කවි ලිවිය යුතු

උපන් කරුමෙට දොළොස් මාසය ගෙවන සා ගින්දරට පෙම් බැඳ
දොරෙන් වහලෙන් හිරුගෙ සරදම් සිනා ගෙට එන පැලක පින් මඳ
අහිංසක දරු පවුලකට හිමි කුවෙර පාලන උරුමයෙන් ලද
දකින්නට දුක් නැතොත් කවි ඇස, අතට නොගනිව් ලියන පන්හිඳ

**කිවි දසුන** - පී. මලල්ගොඩ

එක්තරා මහලු ඍෂිවරයෙක් ගං ඉවුරක් දිගේ ගමන් කරමින් සිටියේ ය. අත්තෙන් අත්තට පනිමින් සතුටින් ගී ගයමින් සිටි කුරුලු යුවළක් ඔහුගේ ඇස ගැටිණි. ඍෂිවරයා මේ දර්ශනයෙන් සතුටට පත් විය. ඒ දෙස ම මඳක් බලා සිටියේ ය. මේ අතරතුර වැද්දකු විසින් විදින ලද හීයකින් කුරුල්ලා මැරී වැටිණි. කිරිල්ලිය ශෝකයෙන් විලාප දෙන්නට වූවා ය. මේ සිදුවීමෙන් ඍෂිවරයාගේ හදවත කම්පා විය. එතුමාගේ මුවින් එසැණින් ශෝක ගීතයක් පිට විය. මේ සිදුවීම මහා බ්‍රහ්මයාගේ නෙත ගැටිණි. එතුමා සිටියේ රාම සීතා කතාව ගීතයෙන් ලිවිය හැකි අයකු පිළිබඳ විමසිල්ලෙනි. ඍෂිවරයාගේ මුවින් පිට වූ ශෝක ගීතය අසත් ම එතුමාට සිතුණේ තමා සොයමින් සිටි කවියා හමු වූ බව යි. මහා බ්‍රහ්මයා ඍෂිවරයාට රාම කුමරුගේ ජීවිත කතාව කියා, එය ගීයෙන් ලියන ලෙස ඉල්ලා සිටියේ ය. එය කල්පාන්තරයක් ලොව බැබළෙනු ඇති බව ද කීවේ ය. ඒ කාව්‍යය නම් රාමායණය යි. ඍෂිවරයා වාල්මීකී ය. මේ රාමායණය නිර්මාණය වීම පිළිබඳ ජනයා අතර මුඛ පරම්පරාගතව පැවතෙන කතාන්දරයකි. මුලින් කී කවිය වාල්මීකීගේ මුවින් පිට වූයේ තම සිත සසල කළ සිදුවීම හේතුවෙනි. එය ඔහු ලද අද්දැකීමකි. වාල්මීකී විසින් රාමායණය රචනා කරන ලද්දේ මහා බ්‍රහ්මයා පැවසූ රාම කුමරුගේ ජීවිත කතාව පදනම් කර ගෙන ය. කවි නිර්මාණය සඳහා එබඳු විවිධ අද්දැකීම් පාදක කර ගත හැකි ය. තමා සැබවින් ම අත්විඳි සිදුවීමක්, පොත් පත්, පුවත්පත් ආදිය කියවීමෙන් ලත් අද්දැකීමක් හෝ වෙනත් අයකු කියනු ඇසූ සිදුවීමක් පදනම් කර ගෙන කාව්‍ය කෘති නිර්මාණය කළ හැකි ය.

කවියා තමා ලබන අද්දැකීම් අතුරෙන් තම හද සසල කළ අද්දැකීම් පාදක කර ගෙන කාව්‍ය නිර්මාණය කරයි. එහෙත් අප සංවේදී කරන සියලු අද්දැකීම් ඇසුරෙන් කාව්‍ය නිර්මාණ බිහි වන්නේ නැත. අද්දැකීමක් ප්‍රතිනිර්මාණය කිරීමෙන්, රසවත් හා පෙර නුදුටු විරූ ආකාරයකින් එය නැවත ගොඩනැගීමෙන් කවි බිහි වෙයි. 6, 7, 8 ශ්‍රේණිවල දී කවි පබැඳීම පිළිබඳව සාකච්ඡා කර ඇත. ඒ කරුණු ද සිහිපත් කර ගැනීම වැදගත් ය.

කවිය යනු භාෂාව භාවිතයෙන් කරන නිර්මාණයකි. භාෂාව හොඳින් හැසිරවීමට හැකි වීම කාව්‍ය නිර්මාණයක දී වැදගත් වේ. කථකයාට හෝ අවස්ථාවට ගැළපෙන බසක් යෙදීම, උපමා රූපක සහිත ව්‍යංග්‍යාර්ථවත් භාෂා භාවිතය ආදි විවිධ උපක්‍රම මගින් කවිය රසවත් හා අර්ථවත් කර ගත හැකි ය.

මහගම සේකර කවියා විසින් අවුකන බුදුරුව නිමිති කර ගෙන රචනා කරන ලද පහත නිර්මාණය විමසා බලන්න.

ඇසේ මතු වන කඳුළු බිඳු ගෙන
ඔබේ සිරිපා දොවන්නම්
හදේ මැලවෙන කැලෑ මල් ගෙන
ඔබේ සිරිපා පුදන්නම්

නො අදහා බුදු කෙනකු දෙවියකු
මානයෙන් වල්මත්ව සිටි මම
ගලක් යැයි ඔබ සිතා සිටියෙමි
තෙතක් හෝ කිසි දයාවක් නැති
ගලින් කළ ඔබ හදින් වෑහෙන
මහා කරුණා ගුණය නො පෙනිණ

කෙලෙස් මල පිරි නුවර අතහැර
බවුන් වඩනට වනේ වැඩි ඔබ
සොයා ආයෙමි පොළෝ තලයේ
අනෙක් පිහිටක් නොමැති වූ විට

ඉහළ නිල්වන් අහස විනිවිද
නැගෙන ඔබගේ යෝද බුදු බඳ
මගේ නෙත සිත මෝහනය කර
මගේ කුදු බව පසක් කර ඇත

ඔබේ පා මුල බැගෑපත් ලෙස
වැටී අයදිමි අහෝ සාමිනි
ජීවිතේ යම් පලක් ඇත් නම්
කිමැයි ඒ මට කියා දුන මැන

කාලාන්තරයක් තිස්සේ ගන වනයේ සැඟව තිබූ අවුකන බුදු රුව දැකීමෙන් විස්මයට පත් වූ ආර්. එල්. බ්‍රෝහියර් තමාට ඇති වූ හැඟීම මෙසේ විස්තර කරයි.

"මේ උත්තුංග මහා රූපය මට පළමු කොට ඇස ගැසුණේ මිනින්දෝරු ත්‍රිකෝණමිතික ස්ථානයක් පිහිටුවීම සඳහා කඳු මුදුනක් සොයමින් සිටි වේලෙහි ය. අප මහ වනය මැදින් පාර කපා ගෙන යන කල්හි අපට මේ ශිලා ස්ථානයත් මානව රූපයේ මේ උත්තුංග ශිලාමය නිරූපණයත් ක්ෂණයෙහි දිස් විය. මහා ඝන වනාන්තරයෙහි පමණක් නිර්මාණය විය හැකි ඒ පුදුම දැඩි නිහැඬියාව මධ්‍යයෙහි මම මා දුටු දෙයින් වශීකෘතව මගෙන් පහව ගිය කතා කර ගැනීමේ ශක්තියෙන් යුතුව තක්බීරිව හිට ගෙන සිටියෙමි. එමතු නොව, ඒ අබියස මා නිකම් ම නිකම් පිග්මියෙකැයි හැඟී ගියෙන් මාගේ මන් බිඳී ගියේ ය. එහෙත් මගේ පියවි සිහිය මා කරා යන්තමින් පෙරළා පැමිණෙත් ම අනුක්‍රමයෙන් මට ප්‍රතිමාවේ පහත සඳහන් ලක්ෂණ විශද වන්ට විය: මුහුණේ නිහඬ නිසංසල ලක්ෂණ හා ඉරියවු, ඉන් ප්‍රකාශ වන්නා වූ පතළ මහා කරුණාව, ප්‍රතිමා ශිල්පියා එයට ගෙන දුන් චිත්ත දමනය හා සුකුමාර සෞන්දර්යය... "

- **සුබස් මිණි ආර**, මහාචාර්ය සුචරිත ගම්ලත්

එක ම අද්දැකීමක් ආශ්‍රිත ඉහත රචනා දෙස බැලීමේ දී බ්‍රෝහියර්ගේ ලේඛනය ඔහුගේ අද්දැකීම් ඍජු ලෙස වර්ණනා කරන්නක් බව පෙනේ. මහගම සේකරගේ නිර්මාණය අවුකන බුදුරුව පිළිබඳ ඍජු වර්ණනයකට වඩා භක්ති පූර්වක හැඟීම් සපිරුණු කාව්‍ය නිර්මාණයක් බව පෙනේ. එය ඍජු අද්දැකීමෙන් ඔබ්බට ගොස් අපගේ හැඟීම් සසල කරන්නකි. එහි භාෂාව රූපකාර්ථවත් ය. "හදේ මැලවෙන කැලෑ මල්, ගලින් කළ ඔබ හදින් වෑහෙන මහා කරුණා ගුණය, කෙලෙස් මල පිරි නුවර, ඉහළ නිල්වන් අහස විනිවිද නැගෙන ඔබගේ යෝද බුදු බඳ..." ආදිය ඊට නිදසුන් ය. බ්‍රෝහියර්ගේ වාර්තාව හා මහගම සේකරගේ කවිය එක ම හැඟීම නියෝජනය කළ ද, කවිය ඉස්මතු වී පෙනෙන්නේ වාර්තාවේ දැකිය නොහැකි සුන්දරත්වයක්, විචිත්‍ර බවක් එහි විද්‍යමාන වන බැවිනි. මෙබඳු නිර්මාණ රස විඳීම ද අද්දැකීම්වලින් පෝෂණය වීම උදෙසා පොතපත පරිශීලනය ද ඔබට කාව්‍ය නිර්මාණය සඳහා වැදගත් වනු ඇත.

## ප්‍රායෝගික අභ්‍යාස

1. **එක ම තේමාවක් පදනම් කර ගෙන පන්තියේ සියලු දෙන ම කවි පන්තිය බැගින් නිර්මාණය කරන්න.**
2. **ඒවා එකතු කර පොතක් සකසන්න. එහි සියලු නිර්මාණ කියවමින් රස විඳින්න. ඒ ඒ අයගේ ප්‍රතිභාවන් අගයන්න. අඩු පාඩු සාකච්ඡා කරන්න.**
3. **විවිධ තේමා, සමාජ පැතිකඩ ඔස්සේ විවිධ කවි නිර්මාණය කරන්න.**